**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, **මූල්‍ය** ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.10,500 ක්වූ කුලී ආදායම් වියදම් ගිණුමේ රු.31,500 ක් ලෙස දැක්වීම නිසා ආදායම් රු.21,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් ලබාදී තිබුණු රු.535,000 ක් වටිනා ට්‍රේලර් ජල බවුසරය, ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ජල ආදායම රු.10,233,534 ක් වුවත් එය ආදායම් වියදම් ගිණුමේ රු.10,523,683 ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් රු.290,149 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සෞඛ්‍ය සේවා ගමන් වියදම් රු.231,883 ක් ආදායම් වියදම් ගිණුමට ඇතුළත් කර නොතිබීම නිසා ආදායම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ලේඛන අනුව බිල්කළ රු.1,909,329 ක් වටිනා වරිපනම් මූල්‍ය ප්‍රකාශනවල රු.1,765,005 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් රු.144,324 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ලේඛන අනුව වර්ෂය අවසානයේ හිඟහිටි වරිපනම් රු.4,405,622 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.4,422,771 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආදායම් හා ආදායම් ණයගැතියෝ රු.17,149 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සක්‍රීයව පැවති දැන්වීම් පුවරු 22 ක් වෙනුවෙන් බිල්කළ ආදායම රු.2,226,890 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.2,409,160 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් රු.182,270 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ආදායම් විෂයයන් 04 ක ශේෂ ඊට අදාල උපලේඛන සමග සැසඳීමේදී රු.151,436 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ අන්තර්ගත හිඟ හිටි ආදායම් හා ප්‍රා.ස. 07 තුළ සඳහන් හිඟහිටි ආදායම් අතර රු.2,441,356 වෙනසක් පැවතුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ අන්තර්ගත ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.315,365 ක වෙනසක් පැවතුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම්
------------------

2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් පැන නැගී උච්චාවචනය වෙමින් පවතින 2017 දෙසැම්බර් 31 දිනට රු.217,153 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
--------------------

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙනඑන එකතුව රු.3,268,521 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.115,622,948 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය හා සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |

| | | |
|---|---|---|
| | 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයින් සභාවේ සේවය අවසන් කළ විට, ඔවුන්ට පාරිතෝෂික ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අරමුදලක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක්ම පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 අංක දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,772,812 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,726,581 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කල ආදායම 2017.01.01 හිඟය වටිනාකම | 2017 රැස්කල ආදායම 2017 බිල්කල මුදලින් වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | රු. |
| වරිපනම් බදු | 3,570,916 | 1,765,004 | 3,570,916 | 729,803 | 4,422,771 |
| කුලී ආදායම් | 5,584,125 | 632,400 | 5,584,125 | 261,100 | 7,391,107 |
| කසල බදු | 118,000 | 710,000 | - | 657,000 | 171,000 |
| උසාවි දඩ | 1,730,658 | 5,048,303 | 1,730,658 | 3,800,000 | 3,011,949 |
| වෙළඳ බලපත්‍ර | 167,940 | - | - | - | 167,940 |
| ජල ආදායම | | | | | |
| ඉහලවාටියව | 1,327,834 | 3,947,011 | 1,327,834 | 3,244,049 | 1,764,781 |
| නොච්චියාම | 2,007,537 | 5,655,940 | 2,007,537 | 5,186,247 | 2,975,272 |
| කුකුල්කටුව | 266,713 | 307,424 | 266,713 | 250,100 | 49,969 |
| හොරුවිල | 185,088 | 323,159 | 185,088 | 304,858 | 235,539 |
| එකතුව | 14,958,811 | 18,389,241 | 14,672,871 | 14,433,157 | 20,390,328 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය
---------------------------------------
සමාලෝචිත වර්ෂයේ සභාව විසින් බිල්කළ ආදායම රු.18,389,241 ක් වුවත් එයින් රැස්කළ ආදායම රු.14,533,157 ක් වූයෙන් එය බිල්කළ ආදායමෙන් සියයට 79 ක් විය.

2.2.3 වරිපනම් හා බදු
------------------
වර්ෂයට බිල්කළ වරිපනම් බදු රු.1,765,004 ක් වුවද එයින් ඉන් සියයට 41 ක් වූ රු.729,803 ක් පමණක් රැස්කර තිබුණි. හිඟ වරිපනම් රු.1,035,201 ක් සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී
------
සමාලෝචිත වර්ෂයට බිල්කළ කඩකුලී හා ගෙවල්කුලී ආදායම රු.632,400 ක් වූ නමුත් රැස්කළ ආදායම රු.261,100 ක් වූයෙන් වර්ෂය අවසානයට හිඟය බිල්කළ ආදායමින් රු.371,300 ක් ද ඇතුළුව තවද කඩකුලීකරුවන් 18 දෙනෙකු වර්ෂ කිහිපයක සිට කුලී ගෙවීම පැහැර හැර තිබුණු අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය ප්‍රකාරව හිඟ කුලී අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්
------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පෞද්ගලික සමාගමක් විසින් ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරුවක් සඳහා 2017 ජුනි 27 දින රු.57,640 ක් බිල්කර තිබුණද 2018 ජුනි 25 දින වන විටත් ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.54,255 ක දැන්වීම් පුවරු 07 ක් සඳහා ගාස්තු අයකර ගැනීමට නොහැකිවීමෙන් එම පුවරු ගලවා ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ දමා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කාර්යසාධනය
-----------------
ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
------------------
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වනවිටත් එකී කාරණා ඉටු කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණද එහි ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් හා දින වකවානු දක්වා නොතිබීම හේතුවෙන් විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනිම

----------------------------------------

පළාත් පාලන අමාත්‍යාංශ මූල්‍ය ආධාර යටතේ රු.4,440,381 ක් වැයකර ඉදිකර තිබුණු කසළ ප්‍රතිචක්‍රීකරණ ගොඩනැගිල්ලට විදුලි සම්බන්ධතාවය ලබා නොදීම නිසා වර්ෂ 04කට ආසන්න කාලයක් තිස්සේ නිශ්කාර්යව පවතී.

(ඈ) පාරිසරික ගැටළු

------------------

සභාවේ දෛනිකව රැස්කරන කසළ ප්‍රතිචක්‍රීයකරණය නොකර කුසුම්පුර සභාවට අයත් ඉඩමක පරිසරයට හිතකර නොවන අයුරින් බැහැර කිරීම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වයට සහ සෞඛ්‍යයට බාධාකාරී වී තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

2016 හා 2017 වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ආදායම ඇස්මේන්තුගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

----------------------------

3.3.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

සභාවට අයත් එකතුව රු.1,349,850 ක් වූ වත්කම් විෂයයන් 05 ක් හා වටිනාකම් හඳුනා නොගත් වත්කම් විෂයයන් 03 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

3.4 ප්‍රසම්පාදනය

--------------

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ ගණුදෙනු හා කාර්යයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3.4.3 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති DMA/2009 (i) චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.

4 පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | අයවැය පාලනය | (i) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම. |
| | | (ii) වියදම් පාලනය සිදු නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | ගිණුම්/පොත්පත් වාර්තා විධිමත්ව පවත්වාගෙන නොයාම. |
| (ඇ) | අභ්‍යන්තර පාලනය | (i) අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) විගණන හා කළමනාකරණ කමිටු නොපැවත්වීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමණාකරනය | විධිමත්ව කසළ බැහැර නොකිරීම. |